ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 32 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම, කර්මාන්තශාලා සහ සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 අගෝස්තු මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 32 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම, කර්මාන්තශාලා සහ සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 අගෝස්තු මස 03 වන දින]

එල්. ඩී—ඕ. 22/83

**කර්මාන්තශාලාවල සහ කාර්මික ව්‍යාපාරවල රාත්‍රියේ දී ස්ත්‍රීන් සේවයෙහි නියුක්තකරවීම සඳහා ද රාත්‍රියේ වැඩකරන ස්ත්‍රීන් ආරක්ෂා කිරීම සඳහා රැකවල් යෙදීම සඳහා සහ ඒ හා සම්බන්ධ වූ හා ඊට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත, 1984 අංක 32 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම, කර්මාන්තශාලා සහ සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවය සහ වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

**1956 අංක 47 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීමේ පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය, මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, කිසිම තැනැත්තකු විසින් වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු රාජ්‍ය හෝ පෞද්ගලික කාර්මික ව්‍යාපාරයක හෝ එහි ශාඛාවක රාත්‍රි කාලය තුළ කවර වූ අවස්ථාවක දී හෝ සේවයේ නියුක්ත නොකරවිය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 2අ, 2ආ සහ 2ඇ අලුත් වගන්ති ඇතුලත් කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුලත් කරනු ලබන අතර, ඒවා, ඒ ප්‍රඥප්තියේ පිළිවෙලින් 2අ, 2ආ, සහ 2ඇ වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය :—

**"යම් කාර්මික ව්‍යාපාරයක රාත්‍රි කාලයේ දී ස්ත්‍රීන් සේවයේ නියුක්ත කරවීම.**

2අ. (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, කාර්මික ව්‍යාපාරයක සේවයෙහි නියුක්ත කරවන ලද සෑම ස්ත්‍රියකටම රාත්‍රිය මුළුල්ලේම වැඩ කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(2) ස්ත්‍රියක් රාත්‍රි කාලයේ දී සේවයෙහි නියුක්ත කරවීම පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය යුතු ය :—

(අ) සිය කැමැත්තට විරුද්ධව කිසිම ස්ත්‍රියකට රාත්‍රිකාලයෙහි වැඩ කිරීමට බල කරනු නොලැබිය යුතු ය;

ඒ 077533—7,075 (84/06)

(ආ) සෑම සේවායෝජකයකු විසින්ම, රාත්‍රී කාලයේ දී ස්ත්‍රීන් ප. ව. 10.00 න් පසු වැඩ කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවීමට පෙර, කම්කරු කොමසාරිස් වරයාගේ ලිඛිත අනුඥාව ලබාගත යුතු ය;

(ඇ) යම් දිනක පෙ. ව. 6.00 සහ ප. ව. 6.00 අතර කාලය තුළ සේවයෙහි නියුක්ත කරවන ලද කිසිම ස්ත්‍රියක ප. ව. 10.00 න් පසු සේවයෙහි නියුක්ත කරනු නොලැබිය යුතු ය;

(ඈ) රාත්‍රී කාලයේ දී වැඩකරන සෑම ස්ත්‍රියක් විසින්ම, ඇය විසින් ලබා ගන්නා සාමාන්‍ය ගෙවීම මෙන් එක හමාරකට නොඅඩු ගෙවීමක් ලැබිය යුතු ය;

(ඉ) රාත්‍රී කාලයේ දී වැඩකරන කම්කරු ස්ත්‍රීන් ගේ සුභ සාධනය පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා පාලිකාවන් පත් කරනු ලැබිය යුතු ය;

(ඊ) රාත්‍රී කාලයේ දී වැඩකරන සෑම කම්කරු ස්ත්‍රියකට ම සේවායෝජක විසින් විවේක කාමර සහ කෑම බීම සපයනු ලැබිය යුතු ය;

(උ) යම් එක් මාසයක් තුළදී කිසිම ස්ත්‍රියක් දින දහයකට වැඩියෙන් රාත්‍රී වැඩ සඳහා සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතු ය.

වගකිවයුතු තනතුරු ආදිය උසුලන ස්ත්‍රීන්ට 2අ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

2ආ. 2අ වගන්තියේ විධිවිධාන—

(අ) කළමනාකරණ හෝ ශිල්පීය ස්වභාවයේ වගකිවයුතු තනතුරු දරන ස්ත්‍රීන්ට;

(ආ) සාමාන්‍යයෙන් කය වෙහෙසා කෙරෙන වැඩවල නොයෙදෙන, සෞඛ්‍ය සහ සුභ සාධක සේවාවල නියුක්ත ස්ත්‍රීන්ට; සහ

(ඇ) එකම පවුලේ සාමාජිකයන් පමණක් සේව යෙහි නියුක්ත කාර්මික ව්‍යාපාරයකට

අදාළ නොවිය යුතු ය

කාර්මික ව්‍යාපාරවල රාත්‍රි කාලයේදී ස්ත්‍රීන් සේවයෙහි නියුක්ත කරවීම අමාත්‍යවරයා විසින් තහනම් කළ හැකි බව.

2ඈ. බරපතල හදිසි අවස්ථාවක දී මහජන යහපත අනුව අවශ්‍ය වන විට, අමාත්‍යවරයා විසින්, සම්බන්ධිත සේව්‍ය සහ සේවක සංවිධාන වෙතොත්, ඒවා විමසීමෙන් පසු, යම් කාර්මික ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල හෝ එහි ශාඛාවල, රාත්‍රි කාලයේ දී ස්ත්‍රීන් සේවයෙහි නියුක්ත කර වීමට අදාළ වූ 2අ වගන්තියේ දක්වා ඇති කොන්දේසි වෙනස්කිරීම හෝ රාත්‍රි කාලයේ ස්ත්‍රීන් සේවයේ නියුක්ත කරවීම තහනම් කිරීම හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කිරීමෙන් ;

(2) (6) වන උපවගන්තියෙහි "පස්වරු 7.00 සිට පස්වරු 11.00 දක්වා" යන වචනවල සිට "කිසිම ස්ත්‍රියකට හෝ තරුණ අයකුට" යන වචන තෙක් වූ සියලුම වචන සහ ඉලක්කම් වෙනුවට "පස්වරු 7.00 සිට පස්වරු 11.00 දක්වා වූ රාත්‍රි කාලය තුළ කිසියම් කාර්මික ව්‍යාපාරයක හෝ එවැන්නක යම් ශාඛාවක තරුණ අය සේවයෙහි යොදනු ලැබීමට අමාත්‍යවරයා විසින්, එසේ සේවයෙහි යොදනු ලබන කිසිම තරුණ අයකුට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

## II වන කොටස

128 වන අධිකාරයේ 67 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. (මෙහි මින්මතු මේ කොටසෙහි "ප්‍රධාන ප්‍රඥප්තිය" යනු වෙන් සඳහන් කරනු ලබන) කර්මාන්තශාලා ආඥාපනතේ 67 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ආ) වයස දහසයට පත් නොවූ තරුණ අය සම්බන්ධයෙන් වන විට සේවා නියුක්ති කාලය යම් දිනකට පැය දොළහ නොඉක්මවිය යුතු අතර, එය, උදේ හයට කලින් ආරම්භ කිරීම හෝ සවස හයට පසුව අවසාන කිරීම නොකළ යුතු ය. තව ද, වයස දහ අටට පත් නොවූ තරුණ අය සම්බන්ධයෙන් වන විට සේවා නියුක්ති කාලය සවස අට පසු වී අවසාන නොවිය යුතු අතර, සතියෙහි එක් දිනක වත් පස්වරු එකට පසුව අවසන් නොවිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 67අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 67 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 67අ වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"කර්මාන්තශාලාවක් තුළ හෝ කාර්මික ව්‍යාපාරයක් තුළ රාත්‍රි කාලයේ දී ස්ත්‍රීන් සේවයේ නියුක්ත කරවීම.

67අ. (1) මේ කොටසේ විධිවිධානවලට යටත්ව, කර්මාන්තශාලාවක සේවයෙහි නියුක්ත කරවන ලද සෑම ස්ත්‍රියකටම, රාත්‍රිය මුළුල්ලේම වැඩ කිරීමට අවසර දෙනු ලැබිය යුතු ය.

(2) ස්ත්‍රියක් කර්මාන්තශාලාවක රාත්‍රි කාලයේ දී සේවයෙහි නියුක්ත කරවීම, පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කරනු ලැබිය යුතු ය :—

(අ) සිය කැමැත්තට විරුද්ධව කිසිම ස්ත්‍රියකට රාත්‍රි කාලයෙහි වැඩ කිරීමට බල කරනු නොලැබිය යුතු ය ;

(ආ) කර්මාන්තශාලාවක සෑම පදිංචිකරුවකු විසින් ම, රාත්‍රි කාලයේ දී ස්ත්‍රීන් ප. ව. 10.00 න් පසු වැඩ කිරීම සඳහා සේවයෙහි නියුක්ත කරවීමට පෙරාතුව කම්කරු කොමසාරිස්වරයාගේ ලිඛිත අනුඥාව ලබා ගත යුතු ය ;

(ඇ) යම් දිනක පෙ. ව. 6.00 සහ ප. ව. 6.00 අතර කාලය තුළ සේවයෙහි නියුක්ත කරවනු ලැබූ කිසිම ස්ත්‍රියක් ප. ව. 10.00 න් පසු සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතු ය ;

(ඈ) රාත්‍රි කාලයේ දී වැඩ කරන සෑම ස්ත්‍රියකටම ඇය විසින් ලබා ගන්නා සාමාන්‍ය ගෙවීම මෙන් එක හමාරකට නොඅඩු ගෙවීමක් ලැබිය යුතු ය ;

(ඉ) රාත්‍රි කාලයේදී වැඩ කරන කම්කරු ස්ත්‍රීන්ගේ ශුභ සාධනය පිළිබඳව සොයා බැලීම සඳහා කාන්තා පාලිකාවන් පත් කරනු ලැබිය යුතු ය ;

(ඊ) රාත්‍රි කාලයේදී වැඩ කරන සෑම කම්කරු ස්ත්‍රියකටම සේවා යෝජක විසින් විවේක කාමර සහ කෑම බීම සපයනු ලැබිය යුතු ය ;

(උ) යම් එක් මාසයක් තුළදී කිසිම ස්ත්‍රියක් දින දහයකට වැඩියෙන් රාත්‍රි වැඩ සඳහා සේවයෙහි නියුක්ත කරවනු නොලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තියේ, (2) වන උපවගන්තියෙහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ආ) ස්ත්‍රිය හෝ තරුණ අය සේවයෙහි නියුක්ත කරවීමේ කාලය යම් දිනකට පැය දොළහ නොඉක්මවිය යුතු අතර, තරුණ අය සම්බන්ධයෙන් වන විට, සේවා නියුක්ති කාලය ආරම්භය සහ අවසානය සඳහා මේ කොටසෙහි සඳහන් වේලාවන්ගෙන් බැහැරව, කාලය දීර්ඝ කරනු නොලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියෙහි (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(අ) ඉරුදිනක හෝ ඉරුදින වෙනුවෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් සතියේ දිනක හෝ තරුණ අයකු කර්මාන්තශාලාවක සේවයේ නියුක්ත කරනු ලැබීම නැතහොත් සතියේ වෙනත් යම් දිනක යම් කර්මාන්තශාලාවක් තුළ සේවයෙහි නියුක්ත තරුණ අයකු කර්මාන්තශාලාවේ ව්‍යාපාරික කටයුතු සම්බන්ධයෙන් හෝ පදිංචිකරු විසින් කරගෙන යනු ලබන වෙනත් යම් ව්‍යාපාරයක, ඉරුදින හෝ ඒ නියමිත සතියේ දිනක සේවයේ නියුක්ත කරනු ලැබීම කරනු නොලැබිය යුතු ය; තව ද".

## III වන කොටස

9. සාප්පු සහ කාර්යාලයීය සේවක (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතේ 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 129 වන අධිකාරයේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ අතුරු වගන්තියෙහි (ii) වන ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

(iii) වයස අවුරුදු දහඅටට පත් වූ යම් කාන්තාවක් ප. ව. 6.00 සහ ප. ව. 8.00 අතර වූ කාලය සඳහා හෝ ඒ කාලයේ යම් කොටසක් සඳහා සාප්පුවක හෝ කාර්යාලයක ව්‍යාපාර කටයුතුවල නැතහොත් සාප්පුවක හෝ කාර්යාලයක ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සේවයෙහි නියුක්ත කරවනු ලැබිය හැකි ය." තව ද

(2) අතුරු වගන්තියේ (iii) වන ඡේදය, එහි (iv) වන ඡේදය යනුවෙන් නැවත අංක කිරීමෙන්.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.